## පළමුවන කියැවීම

ආමොස් 7:12-15

ආමොස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**" ඔබ ගොස් මාගේ සෙනගට දිවැස් වැකි දෙසන්න."**

අමසියා ආමොස් අමතා, "දිවැස් වැකි කියන්නා මෙතැනින් යන්න, ජුදා රටට ගොස් එහි ඔබේ ජීවිකාව කර ගන්න, එහි ඔබේ දිවැස් දෙසුම් කරන්න. මින්පසු දිවැස් දෙසුම් බෙතෙල්හි නොකරන්න. මෙය රජතුමා නමස්කාර කරන ස්ථානය ය. මෙය ජාතික සිද්ධස්ථානය ය"යි කීවේ ය. එයට ආමොස් පිළිතුරු දෙමින් මෙසේ කීවේ ය. "මම රැකියා වශයෙන් දිවැස් වැකි කියන දිවැසිවරයෙක් නොවෙමි. මම ගොපල්ලෙක්මි. අත්තික්කා වගා කරන්නෙක්මි. එහෙත් සමිඳාණන් වහන්සේ එඬේර රැකියාවෙන් පිටත මා කැඳවා, 'නුඹ ගොස් මාගේ ඉශ්රායෙල් සෙනගට දිවැසි වැකි දෙසන්නැ'යි මට නියම කළ සේක."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 85:8-13

පිළිතුර: සමිඳුනි, අප වෙත කරුණා පා අපට ගැළවීම දුන මැනව.

ගීය: දෙවි සමිඳුන් වදාරන වදනට සවන් දෙමි. මන්ද, සිය සෙනගට ද සැදැහැවතුන්ට ද එතුමාණන් තුළ විශ්වාසය තබන අයට ද සමිඳාණෝ සාමදානය දීමට පොරොන්දු වූ සේක.

එතුමන් හට ගරු බිය පාන අයට ගැළවීම ඉතා සමීපව ඇත්තේ ය. සත්තටම එතුමාණන්ගේ මහිමාලංකාරය අප රටෙහි බබළන්නේ ය. තිර පෙම සහ විශ්වාසවන්තකම හමු වන්නේ ය. දැහැමි බව සහ සාමය වැළඳ ගන්නේ ය.

විශ්වාසවන්තකම මිහි තලයෙන් ඉහළට නගින්නේ ය. දැහැමි බව සගලොවින් පහළට බසින්නේ ය. සමිඳාණෝ අප සමෘද්ධිමත් කරන සේක. අපේ දේශය එහි පලදාව නිපදවන්නේ ය. දැහැමි බව එතුමන්ට පෙරටු ව යන්නේ ය. එතුමන්ගේ අඩිපාරේ සාමය වන්නේ ය.

## දෙවන කියැවීම

එපේසි 1:3-14

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**"ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප තෝරා ගත් සේක."**

ක්‍රිස්තුස් වහන්සේ තුළින් ස්වර්ග ලෝකවල සියලු ආධ්‍යාත්මික ආශිර්වාද අපට දෙවා වදාළ, අපේ ස්වාමින් වන, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පියාණන් වූ දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා! ප්‍රේමයෙන් උන්වහන්සේ ඉදිරියෙහි අප ශුද්ධව නොකැලැල් ව සිටින පිණිස, ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප තෝරා ගත් සේක. තවද ස්වකීය ප්‍රසාදය හා අරමුණ අනුව, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන, අප උන් වහන්සේ පිළිගත් පුත්‍රයන් වන පිණිස, දෙවියන්

වහන්සේ පෙර නියම කළ සේක. එබැවින් ප්‍රේමයාණන් වහන්සේ තුළින් තේජවන්ත වරප්‍රසාදයෙන් අපට බෙහෙවින් ආශිර්වාද කළ දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා! ක්‍රිස්තුස් වහන්සේගේ දිවි පිදීම කරණකොටගෙන දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය සම්පතේ ප්‍රකාරයට අපට මිදීමත්, පව්කමාවත් ලැබී ඇත. ඒ වරප්‍රසාදය සියලු ප්‍රඥවෙන් හා නුවණින් උන් වහන්සේ අපට බහුලව ප්‍රදානය කර, උන් වහන්සේගේ කැමැත්තේ අභිරහස අපට දන්වා වදාළ සේක. එසේ කරන ලද්දේ, තමන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළ, සිය කැමැත්තෙන් නියම කරගත් ස්වකීය අභිප්‍රාය අනුව ය. දෙවියන් වහන්සේගේ ඒ අභිප්‍රාය නම්, නියමිත කාලයේ දී ස්වර්ගයෙහි ද පොළෙවෙහි ද, එනම් මුළු විශ්වයේ ඇති සියල්ල, ක්‍රිස්තුස් වහන්සේ යටතේ එක්සත් කිරීම ය. අපි මෙම ක්‍රිස්තුස් වහන්සේ තුළින් තෝරාගත් සෙනගක් වෙමු. එසේ වන්නේ දෙවියන් වහන්සේ පෙර නියමකරගත් සැලැස්ම ලෙස, සියල්ල සිදු කරන ස්වකීය අභිප්‍රාය අනුව ය. එබැවින් ක්‍රිස්තුස් වහන්සේ තුළින් ප්‍රථමයෙන් බලාපොරොත්තු ලැබූ අප, උන් වහන්සේගේ මහිමය ප්‍රශංසා කළ යුතු ය. ඉදින්, උන් වහන්සේ තුළින් ඔබ ද, සත්‍ය ධර්මය වන ඔබගේ ගැළවීම සලසන සුබ අස්න අසා, අදහාගෙන, පොරොන්දු වූ ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබීම කරණකොටගෙන, සහතිකතමේ මුද්‍රාව ලැබුවහු ය. ඒ ශුද්ධාත්මයාණන් වනාහි, දෙවියන් වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව සඳහා, උන් වහන්සේට අයිති අයට ගැළවීම සලසා දෙන අපේ උරුමයේ අත්තිකාරම ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## <u>සාධුකාරය</u>

ජුවාම් 6:63-68

ආලේලූයා! ආලේලූයා!

ස්වාමිනි, ඔබ වහන්සේ වචන ආත්මය ද ජීවනය ද වන්නේ ය. සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය. ආලේලූයා!

## <u>ශුද්ධවූ සුවිශේෂය</u>

මාක් 6:7-13

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**" ජේසුස් වහන්සේ දොළොස් දෙනා කැඳවා ධර්මදූත මෙහෙය සඳහා යැවූ සේක."**

එකල ජේසුස් වහන්සේ දොළොස් දෙනා තමන් වෙත කැඳවා ඔවුන් දෙදෙනා බැගින් පිටත් කර යැවූ සේක. අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලය ද දුන් සේක. ගමනට සැරයටියක් හැර, රොටි වත්, මල්ලක් වත්, පසුම්බිවල මුදල් වත් යන කිසිවක් නොගෙන, වහන් පය ලා, කමිස දෙකක් නොගෙන යන ලෙස ඔවුන්ට අණ කළ සේක. තවද, උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "ඔබ යම් කිසි නිවසකට පිවිසි කල, එතැනින් පිට වී යන තෙක් එහි ම නවතින්න. යම් තැනක දී, ඔවුන් ඔබ පිළිගන්නේ වත් ඔබේ වචන අසන්නේ වත් නැත්නම්, එතැනින් පිට වී යන කල ඔවුන්ට විරුද්ධ ව සාක්ෂියක් වන පිණිස ඔබේ පාදවල තිබෙන ධූලි ගසා දමන්නැ"යි වදාළ සේක. එලෙස ඔව්හු පිටත් ව ගොස් සෙනඟ මනස්ථාපනය විය යුතු ය යි දේශනා කළහ. තවද, ඔව්හු බොහෝ යක්ෂයින් දුරු කොට, බොහෝ රෝගීන් ද තෙලින් ආලේප කොට සුවපත් කළහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.